*Vidyodaya J. Arts, Sci., Lett., Vol.* 4 *Nos.* 1 & 2 *pp.* 76—87, 1971

# ජාතකට්ඨකථාවේ බුද්ධත්වය හා මහාභාරතයේ විප්‍රත්වය පිළිබඳ සංකල්ප

( මාතංග ජාතකය හා මතංගෝපාඛ්‍යානය පිළිබඳ සංසන්දනාත්මක හැදෑරීමක් )

**විද්‍යොදය විශ්වවිද්‍යාලය බුද්ධධර්ම අධ්‍යයනාංශයේ**
**සෝමරත්න වීරසිංහ විසිනි.**

බුද්ධත්වය පිළිබඳ සංකල්පය ක්‍රමයෙන් දියුණු වූවක් බව බෞද්ධ සාහිත්‍යය පරීක්ෂා කර බැලීමෙන් පෙනේ. ථෙරවාදයෙහි බුද්ධත්වය පිළිබඳ සංකල්පය වශයෙන් ජාතකට්ඨකථා නිදානකථාවෙහි එන අදහස් සැලකිය හැකිය. මේ අදහස්වලට බොහෝ සෙයින් සමාන අදහස් රාශියක් මහාභාරතයෙහි විප්‍රත්වය පිළිබඳව ද සඳහන්ව තිබෙන බව පෙනේ. මේ ගැන විශේෂයෙන් මහාභාරත අනුශාසන පර්වයෙහි එන මතංගෝපාඛ්‍යානය[1] සඳහන් කළ යුතුය. මෙයින් පිළිබිඹුවන විප්‍රත්ව සංකල්පය බුද්ධත්ව සංකල්පය මෙන් ක්‍රමයෙන් වැඩී දියුණු වූවක් දැයි කීමට තරම් සෑහෙන කරුණු මේ තාක් අප ඉදිරියේ නැත.

බෞද්ධ සාහිත්‍යයෙහි බුද්ධත්ව සංකල්පය ගෞතම බුදුන්ගේ අතීත හා වර්තමාන චරිත ඇසුරින් ගොඩනැගී තිබෙන අතර මහාභාරතයෙහි එන විප්‍රත්ව සංකල්පය වසල කරනැවැම්යෙකු වූ සොර සැමියෙකුට ජාතකව විවාපත් බැමිණියක කුසින් උපන් මතංග[2] නම් තරුණයෙකුගේ චරිතය වටා ගෙතී ඇත. මේ සංකල්ප දෙකෙහි බොහෝ සෙයින් සමාන අදහස් රාශියක් හා අසමාන තැන් කීපයක් ද දක්නට තිබේ. සමාන අදහස් විමසා බැලීමේ දී ඉතා ප්‍රකටව පෙනෙන අදහසක් නම් බුද්ධත්වය මෙන් ම විප්‍රත්වය ද ලබා ගැනීම අතිශයින් ම දුෂ්කර කාර්යයක් බවයි. මේ දුෂ්කරත්වය ද විවිධය. බෞද්ධයන්ට මෙන් ම හින්දූන්ට ද පුනර්භව සංකල්පය සාධාරණ බව ප්‍රකට කරුණකි. ඒ අනුව සංසාරගත සත්ත්වයෙකුට බුද්ධත්වය මෙන් ම විප්‍රත්වය ලබා ගැනීමට අතිදීර්ඝ කාලයක් ගත වන්නේය. ජාතකට්ඨකථා නිදානකථාවෙහි පෙනෙන පරිදි සුමේධ තවුසාණන් වැනි ප්‍රඥාධික කෙනෙකුට බුද්ධත්වය ලබා ගැනීම සඳහා ගතවන ඉතා ම අඩු කාල පරිච්ඡේදය 'සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකි.'[3] ඇතැමුන්ට මේ කාල පරිච්ඡේදය අටාසංඛ්‍ය හෝ සෝළසාසංඛ්‍ය කල්ප ලක්ෂය තෙක් දික් වන්නේය. තව ද බෞද්ධ අදහසට අනුව සංසාරගත සාමාන්‍ය සත්ත්වයෙකුට සාර්ථක ලෙස බුදු බව ප්‍රාර්ථනා කළ නොහැකිය. සාර්ථක ලෙස බුද්ධත්වය ප්‍රාර්ථනා කරන්නා පහත සඳහන් අංගවලින් යුක්ත විය යුතු බව

---

1. *Mahābhārata*, Anusāsana Parvan, Part 1, Bhandarkar Oriental Research Institute, Poona, 1966 (MBH BORI) 13. 28-30.
   විප්‍රත්ව සංකල්පය ගැබ් කොට ඇති මතංගෝපාඛ්‍යානය ඒ ඒ මහාභාරත පිටපත්වල මදින් මද වෙනස්ව දක්නට ලැබෙන නමුත් සාරාංශ වශයෙන් විශාල වෙනසක් නැත. මේ බව පහත සඳහන් මහාභාරත පිටපත් පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ.
   (i) *Mahābhārata*, Chowkhamba Sanskrit Series, 13. 27-29.
   (ii) *Mahābhārata* (Southern Recension) edited by P. S. S. Sastri, Madras, 1935, 13.3.
2. මාර්ටින් වික්‍රමසිංහගේ 'සිංහල සාහිත්‍යයේ නැගීම' නම් ග්‍රන්ථයෙහි (1963, 108—114 පිටු) මේ නම සඳහන් වන්නේ මාතංග යනුවෙනි. එහෙත් අපට දක්නට ලැබුණු හැම මහාභාරත පිටපතක ම මෙය ඇත්තේ මතංග කියාය.
3. *Jātaka*, Vol. 1, Pail Text Society (Ja. PTS) 1962, p. 15.

ජාතකට්ඨකථා නිදන කථාවෙහි පැහැදිලි ලෙස දක්වා තිබේ.[4] එනම්, මනුෂ්‍යත්වය, ලිංග සම්පත්තිය, ඉහාත්ම භාවයෙහි දී රහත් වීමට තරම් මුහුකුරා ගිය පුණ්‍ය සම්පත්තිය, දිවමන් බුදු කෙනෙකුන් සමීපයෙහි දී ප්‍රාර්ථනා කිරීම, පැවිද්දෙකු වීම, පංචාභිඥා අෂ්ට සමාපත්ති ලාභිත්වය, බුදුනට ජීවිත පරිත්‍යාග කිරීමට තරම් ආත්ම ශක්තියකින් යුක්ත වීම, බුද්ධකාරක ධර්ම සෙවීමෙහි හා පූරණයෙහි ඇති ඉමහත් ධෛර්යය යනුයි. මෙහි අටවැනි අංගය වශයෙන් දක්වා තිබෙන ඡන්දතාව හෙවත් බුදුබව ලබා ගැනීමේ අභිලාෂය හා එක්ව යායුතු අප්‍රතිහත ධෛර්යය විශේෂයෙන් මෙහි දී අවධාරණය කොට තිබෙන බවත් එයින් ම බුදුබව ලබා ගැනීම අති දුෂ්කර කාර්යයක් බවත් පහත සඳහන් ජාතකට්ඨකථා විස්තරයෙන් පෙනේ : " යමෙක් එකම ජලාශයක් වූ මුළු සක්වළ ගැබ මෙතෙර සිට එතෙරට බාහු බලයෙන් පිහිනා යන්නට,... හුණ ලැහැබින් පිරුණු මුළු සක්වළ ගැබ පයින්ම මැඩගෙන මෙතෙර සිට එතෙරට යන්නට,... අතුරු සිදුරු නොමැතිව සිටුවන ලද සැතින් පිරුණු මුළු සක්වළ ගැබ මෙතෙර සිට එතෙරට පයින්ම යන්නට, ... දිලිසෙන පුලිඟුයෙන් පිරුණාවූ මුළු සක්වළ ගැබ පයින් ම තරණය කරන්නට සමත් වේද, හේ බුදු බවට පැමිණේ. යමෙක් මේවායින් එකක් වත් දුෂ්කර යයි නොසිතා මෙබඳු සක්වළ ගැබ තරණය කිරීමෙහි මහත් අභිලාෂයෙන්, උත්සාහයෙන්, ව්‍යායාමයෙන් හා ගවේෂණයෙන් යුක්ත වේ නම් ඔහුගේ ප්‍රාර්ථනය සමෘද්ධ වේ. නො එසේ වූවහුගේ ප්‍රාර්ථනය සමෘද්ධ නොවේ. "[5]

මෙහි ඉහත දැක්වූ බුද්ධත්වය පිළිබඳ අදහස් කීපයම පහත සඳහන් කෙරෙන ඉද්‍ර වාක්‍යයෙහි ගැබ්වන බව පෙනේ. තමා නියම බ්‍රාහ්මණයෙකු නොවන බව දැන ගැනීමෙන් පසු මහ වනයට ගොස් විප්‍රත්වය පතා අති උග්‍ර තපෝව්‍රතයක් ආරම්භ කළ මතංග වෙත පැමිණි ඉන්ද්‍ර, "දේවාසුර මනුෂ්‍යයන් අතර අතිශයින් ම පවිත්‍ර වූ විප්‍රත්වය චණ්ඩාලයෙකුට කිසිසේත් නොලැබිය හැකි බව "[6] ස්ථිර වශයෙන් ම ප්‍රකාශ කෙළේය. මෙයින් අධෛර්යට නොපැමිණි මතංග විප්‍රත්වය ම පතා ආත්ම සංවරයෙන් යුක්තව සම්පූර්ණ හවුරුදු සියයක් ම එක පයින් නැගිට සිටීමේ මහත් දුෂ්කර ව්‍රතයක් පටන් ගති. ශත වර්ෂය ඉක්ම ගිය පසු නැවතත් පැමිණි ඉන්ද්‍ර කෙනෙකු විප්‍රත්වය ලබා ගත යුතු ආකාරය මතංගට විස්තර කර දුන්නේ මෙසේ ය : " තිර්යග්යෝනිගත සත්ත්වයා ඉඳින් මිනිසත් බවක් ලබන්නේ නම් හේ පළමු කොට උපදින්නේ ඉතා පහත් මිශ්‍ර වර්ගයක් වූ පුල්කස, වේශ්‍යා කර්මයෙන් ජීවත්වන පුංශ්චල හෝ චණ්ඩාල වැනි පාප යෝනියකය. මේ මිනිසාධමයා ඉතා දීර්ඝ කාලයක් නැවත නැවත මැරෙමින් නැවත නැවත උපදින්නේ මෙවැනි ම පහත් තත්ත්වයක මය. මේ පහත් ගතියෙන් මිදී ඊට මඳක් උසස් ශුද්‍ර නම් මිනිස් තත්ත්වය ලබා ගැනීමට එමෙන් දශගුණිත කාලයක් හෙවත් හවුරුදු දහසක් ගත වේ. මින්පසු මොහුට වෛශ්‍ය තත්ත්වය ලබා ගැනීමට හවුරුදු තිස් දහසක් පසු විය යුතුය. වෛශ්‍ය තත්ත්වයට වඩා උසස් සේ සැලකෙන රාජන්‍ය හෙවත් ක්ෂත්‍රිය බව ඔහුට ලබා ගත හැක්කේ තවත් ෂෂ්ටි ගුණිත තිස් දහසක් (30,000× 60) හවුරුදු ගත වූවාට පසුවය. මේ කාල සීමාව ද තවත් සැට ගුණයකින් වැඩිවූ විට ය (30,000× 60× 60) ඔහු බ්‍රහ්මබන්ධු හෙවත් සාමාන්‍යයෙන් පහත් බමුණු අවස්ථාවට පැමිණෙන්නේ. නැවත ඔහුට කාණ්ඩපෘෂ්ඨ හෙවත් හී ආදී අවි ආයුධ සාද විකොට ජීවත් වන බමුණෙකු විය හැක්කේ ඉහත කී කාලසීමාවත් තවත් ශතවර්ෂ දෙකකින් ගුණිත වූවාට (30,00× 60× 60× 200) පසුවය.

4. 'මනුස්සත්තං ලිංගසම්පත්ති හෙතු සත්ථාරදස්සනං
පබ්බජ්ජා ගුණසම්පත්ති අධිකාරො ච ඡන්දතා
අට්ඨධම්මසමොධානා අභිනීහාරො සමිජ්ඣති. එම 14 පිටුව.

5. එම 14, 15, පිටු. මෙහි දැක්වූයේ මුල් ඡේදයෙහි සාරාංශ පරිවර්තනයකි.

6. දෙවාසුරමර්ත්‍යෙෂු යත් පවිත්‍රං පරං ස්මෘතම්,
චණ්ඩාලයොනෞ ජාතෙන න තද් ප්‍රාප්‍යං කථංචන.
MBH. BORI, 13. 28. 28.

මේය ද නැවත ශත වර්ෂ තුනකින් ගුණිත වූවාට ($30,000 \times 60 \times 60 \times 200 \times 300$) පසු ඔහු මතුරු පිරිවහන ගායත්‍රී නම් බමුණු අවස්ථාවට පැමිණේ. මින් පසු වේද නිපුණ ශෝත්‍රිය නම් බමුණෙකු වීමට ඒ කාල සීමාව ද තවත් හාරසිය ගුණයකින් ($30,000 \times 60 \times 60 \times 200 \times 300 \times 400$) වැඩි විය යුතුය. මේ ශෝත්‍රිය අවස්ථාවෙහි පසු වන්නාවූ විප්‍රත්වාභිලාෂියා විසින් ද ක්‍රෝධහර්ෂ, කාමද්වේෂ, අතිමානාතිවාදදි කෙලෙස් සතුරන් පැරදවීමෙහි ලා සමත් වුවහොත් පමණකි අන්තිමේ දී බ්‍රාහ්මණ්‍යය හෙවත් විප්‍රත්වයයි කියනු ලබන ඒ උතුම් සත්ගතිය ලැබ ගත හැක්කේ. නො එසේ වූව තල් ගසක මුදුනෙහි සිටියකු බිමට ඇද හැලෙන්නා සේ නැවත ඔහු මුල් තත්ත්වයට ම ඇද වැටේ.''[7]

මෙහි මුලින් සඳහන් කළ බුද්ධත්වය පිළිබඳ අදහස් මේ ඉන්ද්‍ර වාක්‍යගත විප්‍රත්වය හෙවත් බ්‍රාහ්මණ්‍යය පිළිබඳ ඇතැම් අදහස් සමග බොහෝ සෙයින් ගැළපී යන බව පෙනේ. එනම්, බුද්ධත්වය මෙන් ම විප්‍රත්වය ද අති දීර්ඝ කාලයක් සසර සැරිසැරීමෙන් පසු ලබා ගත යුතුය. බුදු බව සඳහා කරන ප්‍රාර්ථනය සාර්ථක වන්නේ මනුෂ්‍යත්වය, ලිංග සම්පත්තිය ආදී කරුණු අටකින් සමන්විත ගුණධර්ම අතින් ඉතා දියුණු තත්ත්වයක සිටින්නෙකුටය. එසේ ම විප්‍රත්වය ප්‍රාර්ථනා කරන්නා ද, ශෝත්‍රිය නම් ඉතා උසස් තත්ත්වයට පත්ව සිටිය යුතුය. දෙදෙනා තුළ ම ස්වකීය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමෙහි ලා අසමසම ධෛර්යයක් තිබිය යුතුය. මෙපමණක් නොව ඉහත සඳහන් කළ කරුණුවලින් එක්තරා ප්‍රමාණයකට සමාන තවත් අදහසක් නම් චණ්ඩාලයෙකුට විප්‍රත්වය කිසිසේත් නොළැබිය හැකි බවයි. මේ අදහස ද බෞද්ධ සංකල්පයෙහි නැත්තේ නොවේ. තුසිත දෙව්ලොවින් චුතව බුදු වීම සඳහා මනු ලොව ඉපදීමට අදහස් කළ බෝසතුන් බැලූ පස් වැදැරුම් කරුණුවලින් එකකි කුලය. මෙහි කුලය යන්නෙන් අදහස් කර ඇත්තේ ක්ෂත්‍රිය හෝ බ්‍රහ්මණ වංශයයි.''[8]

මේ සිද්ධාන්ත දෙක පිළිබඳ කථා පුවත් තව දුරටත් විමසා බලන කල ඉතා ප්‍රකටව පෙනී යන සමානත්වයක් ඇත්තේ ගෞතම, මතංග යන තාපසවරුන් දෙදෙන පිළිවෙළින් බුද්ධත්වය හා විප්‍රත්වය පතා අන්තිමේ දී කළ ඉමහත් දුෂ්කර ක්‍රියාවෙහිය. මහාභිනිෂ්-ක්‍රමණයෙන් පසු තවුස්වෙස් ගත් ගෞතම බෝසතුනට ආළාරකාලාම, උද්දකරාමපුත්ත වැනි එකල විසූ සුප්‍රකට තවුසන්ගේ පවා මග පෙන්වීම අසාර්ථක විය. එබැවින් උන්වහන්සේ ගයා පෙදෙසෙහි රමණීය උරුවේලා නම් භූමි භාගයට ගොස් බුදු බව ලබා ගනු පිණිස මහත් දුෂ්කර ක්‍රියාවක් කළහ. පුරා සවසක් කළ මේ දුෂ්කර ක්‍රියාව ගැන ජාතකට්ඨකථාවෙහි සඳහන් වන්නේ ඉතා සැකෙවිනි. එම සටහනට අනුව බෝසතුන් අන්තිමේ දී දවස ගත කළේ තල, සහල් ආදී ධාන්‍ය ඇටයකින් පමණි. ඇතැම්විට සම්පූර්ණයෙන් ආහාර ගැනීම නවත්වා ලූහ. මෙයින් අතිශයින් ම කෘශ වූ උන්වහන්සේගේ රන්වන් සිරුර කාල වර්ණ විය. දෙතිස් මහ පුරිස් ලකුණු යටපත් විය. මෙසේ නිරාහාරව ධ්‍යාන භාවනාවෙහි ම යෙදුණු උන්වහන්සේ දිනක් සිහිසන් නොමැතිව සක්මන් කෙළවර ඇද වැටුණාහ. මෙය දුටු ඇතැම් දේවතා කෙනෙක් ශ්‍රමණ ගෞතමයන් කාලක්‍රියා කළහයි ද පැවැසූහ.[9] මේ පිළිබඳව බුදුන් වහන්සේ ම කරන විස්තරයක් මජ්ඣිම නිකායට අයත් මහා සීහනාද සූත්‍රයෙහි මෙසේ දැක්වේ. '' ආහාරයෙන් පාරිශුද්ධිය ලබා ගත හැකිය යන ඇතැම් මහණ බමුණන්ගේ අදහස පරිදි මම ද කෝල හෙවත් බදර ඵලයක් පමණකින් මුං ඇටයක්, තල ඇටයක්, සහල් ඇටයක් පමණකින් දවස ගත කෙළෙමි. මෙයින් මාගේ ශරීරය අතිශයින් ම කෘශ විය. මාගේ ශරීරාවයව ආසීතික

7. MBH. BORI. 13. 29 5—15
8. Ja. PTS. Vol. 1, p. 49.
9. එම 67 පිටුව

ලතා හෝ කාල ලතා මෙන් විය. මාගේ ආනිසඳය ඔටු පියක් මෙන් විය. මාගේ කොඳු ඇටය වට්ටනාවලියක් මෙන් විය. මාගේ ඉල ඇට දිරා ගිය ගෙයක කඩ කඩව ගිය ගොනැස් මෙන් විය. යටට ගිලී ගිය මාගේ ඇස් ගැඹුරු ළිඳක දිය කැනිත්තක් දිස් වන්නා සේ විය. හැකිලී මැළව ගිය හිසෙහි සම අමුවෙන් කඩා වියළන ලදුව හැකිලී ගිය තිත්ත ලබු ගෙඩියක පොත්ත මෙන් විය. බඩ සම ස්පර්ශ කරන කල්හි කොඳු ඇටය අතට හසුවන තරම් උදරච්ඡවිය කොඳු ඇටයෙහි ඇලී ගියේ විය. මළ මූ කිස පිණිස ගිය විට මුනින් ඇද වැටුනෙමි. සැනසුම් පිණිස අතින් ඇඟ පිරිමදින විට දිරා ගිය මුල් ඇති ලොම් ශරීරයෙන් ගැල වී ගියේය. ''[10]

විවාපත් බැමිණියක කුස උපන්නත් තමා වසල කරනැවැමියෙකුට ජාතක බව දැනගත් මතංග විලියෙන් මිරිකී නියම විප්‍රත්වය ලබා ගනු පිණිස මහ වනයට ගොස් ආරම්භ කළේත් ඉමහත් දුෂ්කර තපසෙකි. මෙය දැනගත් ඉන්ද්‍ර කිප විටක් ම ඔහු වෙත පැමිණ ඔහුගේ පරමාර්ථය ඉෂ්ට නොවන බව පවසා අන් වරයක් ගන්නා ලෙස අවවාද දුන් නමුත් එයින් මඳකුදු අධෛර්යයට නොපැමිණ මතංග ආත්ම සංවරයෙන් යුක්තව සම්පූර්ණ ශත වර්ෂයක් ම එක පයින් නැගිට සිටීමේ මහත් දුෂ්කර ව්‍රතයක් පිරීය. මෙයින් ද නොනැවතුණු මතංග ඉහත සඳහන් කළ ඉන්ද්‍ර වාක්‍යය පවා නොතකා ගයා පෙදෙසට ගොස් ඊළඟට කෙළේ තවත් ශත වර්ෂයක් පයේ මහපටඟිල්ලෙන් නැගිට සිටීමේ අතිමහත් දුෂ්කර ව්‍රතයකි. මෙහි දී අතිශයින් ම කෘශව ගිය ඔහුගේ ශරීරයෙහි නහර ඉල්පිණි. සම හා ඇට කටුව පමණක් ඉතිරි විය. බිම ඇද හැලෙන්නට ඔන්න මෙන්න කියා සිටියදී එහි පැමිණි ඉන්ද්‍ර අල්වා ගත් හෙයින් යම්තම් පණ රැකුණි. ''[11]

මේ දුෂ්කර ක්‍රියා දෙක බොහෝ සෙයින් ම සමාන බව පැහැදිලිය. මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුත්තක් නම් මේ තාපසවරුන් දෙදෙනා ම ස්වකීය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම පිණිස තවුස් දම් පිරීමෙහි ලා සුදුසු ස්ථානය වශයෙන් ගයා පෙදෙස තෝරා ගැනීමයි. මීළඟට පෙන්විය හැකි තවත් සැලකිය යුතු කරුණක් නම් මේ දෙදෙනාගේ ම ඉදිරි ගමන් නැවැත්වීමට අලෞකික පුද්ගලයන් දෙදෙනෙකු කළ උත්සාහයයි. සිදුහත් තවුසාණන්ගේ බුද්ධත්ව ලාභය වැලක්වීමට මාරයා කිහිප වතාවක් ම උත්සාහ කළ අතර මතංග තවුසාණන්ගේ විප්‍රත්ව ලාභය කිසියම් න්‍යාය ධර්මයක් උඩ නොලැබිය හැකි බව ඉන්ද්‍ර දෙවිඳු නැවත නැවත පෙන්වා දුන්නේය. මේ මාර, ඉන්ද්‍ර දෙදෙනාගේ ක්‍රියා කලාපයන් සම්පූර්ණයෙන් ම සමාන නුවූවත් දෙදෙනාට ම පොදු ලක්ෂණයක් මෙහිදී මතුකර පෙන්විය හැකිය. එනම්, අති ශ්‍රෙෂ්ඨ අභිමතාර්ථ දෙකක් ඉටුකර ගැනීම පිණිස අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියා කළ ගෞතම, මතංග යන තාපසවරුන් දෙදෙනාට ම ඒ මූලික අභිමතාර්ථ සිද්ධිය පිණිස මාර, ඉන්ද්‍ර දෙදෙනා ම කිසි ම දිරියක් නොදී වෙනයම් දෙයකින් රැවටීමට උත්සාහ කිරීමයි. මහාභිනික්මන් සඳහා නුවර දොරින් නික්මෙන සිදුහත් කුමරුන් වෙත පැමිණි මාරයා, '' නිදුකාණෙනි, නොයනු මැන. ඔබට මින් සත්වැනි දින චක්‍ර රත්නය පහළ වන්නේය. ඔබ දෙදහස් කොදෙව් පිරිවර කොට ඇති සතර මහ දිවයිනෙහි රජ වන්නෙහිය. නිදුකාණෙනි, නවතින්න''යි කී විට සිදුහත් කුමරුන් පිළිතුරු දුන්නේ, ''මාරය, මම චක්‍ර

---

10. *Majjhima-nikāya*, Vol. 1, PTS, 1948, pp. 80, 81
මෙහි දැක්වූයේ සාරංශය පමණි. දුෂ්කර ක්‍රියාව පිළිබඳව තව දුරටත් විස්තර සඳහා බලන්ගොඩ, ආනන්ද මෛත්‍රෙය නායක ස්ථවිරයන්ගේ බුද්ධ චරිතයෙහි (1955) 17—19 පිටු බැලිය යුත්තේය.

11. 'ඒවමුක්තො මතඞ්ගස්තු භෘශං ශොකපරායණඃ,
අතිෂ්ඨත ගයාං ගත්වා සොඞ්ගුෂ්ඨෙන ශතං සමාඃ.
සුදුෂ්කරං වහන්යොගං කෘශො ධමනිසංතතඃ.
ත්වගස්ථිභූතො ධර්මාත්මා ස පපාතෙති නඃ ශ්‍රුතම්.
තං පතන්තමභිද්‍රුත්‍ය පරිජග්‍රාහ වාසවඃ,
වරාණාමීශ්වරො දතා සර්වභූතහිතෙ රතඃ. MBH. BORI, 13. 30. 1-3.



11—11886

රත්නය පහළ වන බව දනිමි, රජයෙන් කම් නැත, දස දහසක් ලෝද්‍ර කම්පා කොට බුදු වෙමි.''[12] යනුවෙනි. බෞද්ධ සාහිත්‍යයෙහි මීටත් වඩා බොහෝ පැරණි වාර්තාවකට අනුව ගෞතම තවුසාණන් නොමඟ යවනු පිණිස මාරයා කළ තවත් උත්සාහයක් විස්තර වන්නේ මෙසේය : '' පරම ශාන්තිය ලබා ගනු වස් නේරංජරා නදී තීරයෙහි සිට ප්‍රධන් වීර්යයෙන් යුක්තව මහත් ආයාසයෙන් ධ්‍යාන භාවනාවෙහි යෙදී සිටි මා වෙත පැමිණි නමුචි නම් මාර තෙම කරුණාවෙන් මෙන් මෙසේ කීය. '' ඔබගේ ශරීරය අතිශයින් ම කෘශව දුර්වර්ණ වී තිබේ. මරණයට ඉතා ආසන්නව, බෙහෙවින් ම ඊට නැඹුරුව සිටින ඔබට ජීවත් වීමට ඇති ඉඩ ඉතා මඳය. පින්වත, ජීවත්වීමට උත්සාහ කරන්න. ජීවිතය යහපත් දෙයකි. ජීවත්ව සිට පින් කර ගන්න. බඹසර හැසිරෙන්නාහට ගිනි පුදන්නාහට, ලැබෙන පින ඉමහත්ය. ප්‍රධන් වීර්යයෙන් කළ හැක්කේ කුමක් ද? එය මහත් දුෂ්කර මාර්ගයෙකි'' යනුයි. මෙහි දී බෝසතාණෝ, '' පවිට, මට ස්වල්ප වූ ද පිනෙකින් කම් නැත. පිනින් ප්‍රයෝජන ඇත්තන්හට එසේ කියව''යි[13] මාරයා පිටමං කළහ.

ඉහත සඳහන් කළ මාරයාගේ මූලික උත්සාහයට මතංග වෙත පැමිණි ඉන්ද්‍රගේ උත්සාහය බොහෝ දුර සමානයයි කිය යුතුය. මුලින් ඉන්ද්‍ර මතංගට කීයේ ලෝකයෙහි අති ශ්‍රේෂ්ඨ විප්‍රත්වය චණ්ඩාලයෙකුට කිසිසේත් නොලැබිය හැකි බැවින් වෙන යම් කැමැති වරයකින් තෘප්ත වන ලෙස ය. එයින් පසු බට නොවී ව්‍රත පූරණයෙහි ම නියැලුණු මතංගට දෙවෙනි වර එහි ඇති බැරෑරුම් කම සිද්ධාන්තයකින් පෙන්වා කැමැති වරයක් ගන්නා ලෙස කියා සිටියේ ය. අන්තිමේ දී හොඳට ම දුබලව සිටි මතංග එ කෙණෙහි විය හැකි ව තුබූ මරණයෙන් මුදා ගෙන තම අදහසට නොකැමැත්තෙන් වුව ද නම්මා ගති. මේ පිළිබඳව මෙහිදී ම සඳහන් කළ යුතු විශේෂත්වයක් ද ඇත්තේය. එනම්, මාරයා කෙතරම් උත්සාහ කළත් ඔහුගේ අදහසට සිදුහත් තවුසාණන් නම්මා ගැනීමට කිසි විටෙකත් නොහැකි වීමයි. එහෙයින් ම කෝපයට පත් මාරයා ගොයුම් ගොත් තවුසාණන් සමග බිහිසුණු සටනක් කළ බව ද බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ.[14] තව ද, මතංගෝපාඛ්‍යානයට අනුව මතංග තවුසාණන් සමග ඉන්ද්‍ර දෙවියන්ට එරෙහි වීමක් හෝ විරුද්ධ සටනක් කිරීමට අවශ්‍ය නොවීය. මෙහි ඉන්ද්‍රගේ චරිත ලක්ෂණ වශයෙන් පෙනී යන්නේ නොකළ හැකි, නොලැබිය හැකි දෙයක් සඳහා කරන උත්සාහයෙන් මතංග තවුසාණන් වළක්වා ඔහුට වෙනයම් ඉෂ්ටාර්ථ සිද්ධියක් කර දීමයි. අනික් අතට බෞද්ධ සාහිත්‍යයෙහි පෙනී සිටින මාරයාට අවශ්‍ය වූයේ කළ හැකි, එසේ ම ලැබිය හැකි ඒ අති උතුම් තත්ත්වය සිදුහත් තවුසාණන්ට අහිමි කර ලීමයි.

තව දුරටත් බලන කල, බෞද්ධ අදහසට අනුව යටත් පිරිසෙයින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් වත්, සමතිස් පෙරුම් පුරා අවශ්‍ය දෑ සම්පූර්ණ කළ බෝසතුනට පවා බුදුබව ලබා ගත හැකි වූයේ අවසාන ආත්ම භාවයේ දී දස මරුන් බිඳ හැරීම ආදි මහත් දුෂ්කර ක්‍රියා සමූහයකින් පසුවය. මේ නයින් සලකා බලත් ම මුල් තත්ත්වයට ඇද වැටීමේ කථාවක් බෞද්ධ සිද්ධාන්තයෙහි නැතත්, අවසාන ශෝත්‍රිය අවස්ථාවේ දී වුව ද විප්‍රත්වාභිලාෂියා විසින් කෙලෙස් සතුරන් පැරදවිය යුතුය යන ඉහත කී ඉන්ද්‍ර වාක්‍යගත හින්දු අදහසට මෙය ද ගැළපී යන බව පෙනේ. මේ දෙදෙනාගේ අධිෂ්ඨාන ශක්තියෙහි ද ඇත්තේ වෙසෙසින් කැපී පෙනෙන සාම්‍යයකි. මුල දී ඉන්ද්‍රගේ අවවාදයට නොනැමුණු මතංග තවුසාණෝ සම හා ඇට කටුව පමණක් ඉතිරිවන තෙක් ස්වකීය ස්ථිර අධිෂ්ඨානය

12. Ja. Vol. 1, PTS, p. 63.
13. *Sutta-nipāta*, PTS, 1948, pp. 74, 75.
14. Ja. Vol. 1, PTS, pp. 71-74. මේ විස්තරය සමග සුත්ත නිපාතයෙහි ප්‍රධාන සූත්‍රය සසඳා බලන්න.

අත් නොහළහ. ගොයුම්ගොත් තවුසාණන් ද සම හා ඇට කටුව පමණක් ඉතිරි වන තෙක් වීර්ය කොට අභිමතාර්ථ සිද්ධිය නොවූයෙන් ඒ අත්තකිලමථානුයෝගය අත් හැර දමා මැදුම් පිළිවෙතින් ක්‍රියා කොට අවසානයේ දී බෝමුල පලක් බැඳ ගත්තේ " හුදෙක් සම්, නහර, ඇට ඉතිරි වන තෙක් මස් ලේ වියලී ගියත්, සම්‍යක්සම්බෝධියට නොපැමිණ මේ අසුනින් නොනැගිටිමි" [15] යන අවිජහිත අධිෂ්ඨානයෙනි.

මීළඟට මෙහි සඳහන් කළ යුත්තේ බුද්ධත්ව, විප්‍රත්ව යන සංකල්ප දෙකට වෙන් වෙන් වශයෙන් ඒවාට ම ආවේණික ලක්ෂණ කීපයක් ද තිබෙන බවයි. බෞද්ධ අදහසට අනුව මෙහි ඉහත සඳහන් කළ පරිදි කෙනෙකු විසින් බුද්ධත්වය ප්‍රාර්ථනා කළ යුත්තේ දිවමන් බුදු කෙනෙකුන් සමීපයෙහි දීය. එසේ කොට ඒ දිවමන් බුදුන්ගෙන් ලද 'නියත විවරණ' නම් අභිමතාර්ථ සිද්ධිය ඒකාන්ත බව දක්වෙන අනාගත වාක්‍යයකින් ධෛර්ය වත් විය යුතුය.[16] මෙවැනි අදහසක් හින්දු සංකල්පයට අයත් බවක් නොපෙනේ. ඒ මේ නියත විවරණයෙන් පසු නවක බෝසතෙකු විසින් කළ යුත්තේ දාන, සීලාදි දස පෙරුම් දම්[17] පුරමින් සසර සැරිසරනාතර තව තවත් බුදුවරුන්ගෙන් නියත් විවරණ ලැබීමයි.[18] මේ අදහස ද හින්දු සංකල්පයෙහි නැත්තේය. සුමේධ තවුසාණන් වැනි නවක බෝසතුන් කෙතරම් දීර්ඝ කාලයක් සසර ගමන් කළත් අවීචියෙහි හෝ ලෝකාන්-තරිකය වැනි නරකයක හෝ නිජ්ඣාම තණ්හා, ඛුප්පිපාසා වැනි ප්‍රේත ලෝකයක හෝ නූපදින බව ද පැවැසේ. කිසි කලෙකත් ක්ෂුද්‍ර තිරිසන් යෝනියක නූපදින මොවුහු මිනිසුන් වශයෙන් උපන් කල ජාත්‍යන්ධ, ජාතිබධිර වැනි අභව්‍ය පුද්ගලයෝ හෝ ස්ත්‍රීහු නොවෙති. ආනන්තරිය අකුශල කර්මයන් නොකොට මිසදිටු ද නොව භවයෙන් භවයට යන මොවුහු ස්වර්ගයන් අතුරින් අසඤ්ඤතල ,සුද්ධාවාස යන ස්ථානයන්හි ද නූපදිත්.[19] එහෙත් හින්දු සිද්ධාන්තය අවධාරණයෙන් ම පවසන්නේ ශෝත්‍රිය තත්ත්වයට පත් විප්‍රත්වාභිලාෂියා වුව ද ක්‍රෝධහර්ෂ, කාමද්වේෂාදී කෙලෙස් නැති නොකළහොත් ඔහු නැවත මුල් තත්ත්වයට ම ඇද වැටෙන බවයි.[20] මෙයින් පෙන්වා දෙන්නේ නියත විවරණ ලත් බෝසත් කෙනෙකුට කවදා හෝ බුදු බව ලබා ගත හැකි අතර ශෝත්‍රිය නම් ඉතා දියුණු අවස්ථාවට පත් බමුණාට පවා විප්‍රත්ව ලාභය සැක සහිත බවයි.

මේ සංකල්ප දෙක අතර දක්නා ලැබෙන විශේෂ සැලකිල්ලට භාජන විය යුතු වෙනසක් නම් බෞද්ධ සංකල්පය හුදු ගුණ ධර්මයට ම මුල් තැන දෙන අතර හින්දු සංකල්පය ගුණ ධර්මයට වඩා වර්ණ ධර්මයට මුල් තැන දීමයි. බෞද්ධ අදහසට අනුව සන්මාර්ගාවතීර්ණ ඕනෑ ම කෙනෙකුට ස්වකීය ගුණධර්ම පූරණයෙහි අග්‍ර ඵලය ස්වාභි-ප්‍රායානුකූලව යථා කාලයේ දී ලබා ගත හැකිය. එහෙත් හින්දු අදහස එසේ ම යයි කීම උගහට ය. විප්‍රත්වය හුදු ගුණධර්මයෙන් ම හෝ ව්‍රත පූරණයෙන් ම සිද්ධ කට හැක්කක් නොව බොහෝ කාලයක් සසර සැරිසැරීමෙන් පසුව එන කිසියම් ආත්ම-භාවයකදී ලැබෙන්නකි. මේ බව,

---

15. එම 71 පි. පධාන සූත්‍රය ද බලන්න.
16. එම 15 පි.
17. එම 20—25. පිටු.
18. එම 30—34 පිටු.
19. එම 44,45 පිටු.
20. "තදෙවං ශොකහර්ෂෞ තු කාමද්වේෂෞ ච පුත්‍රක,
අතිමානාතිවාදෞ ච ප්‍රවිශෙතෙ ද්විජාධමම්.
තාංශ්චේජ්ජයති ශත්‍රූන් ස තද ප්‍රාප්නොති සද්ගතිම්,
අථ තෙ වෛ ජයන්ත්‍යෙනං තා ලාග්‍රාදිවා පත්‍යතෙ."
MBH. BORI, 13. 29. 14, 15.

"බහ්වීස්තු සංසරන් යෝනීර් ජායමානඃ පුනඃ පුනඃ,
පර්යායේ තාත කස්මිංශ්චිද් බ්‍රාහ්මණො නාම ජායතෙ."[21]

යන මහාභාරත කියමනින් පැහැදිලිය. මෙයින් ගුණධර්ම පූරණයට වඩා අති දීර්ඝ කාල පරිච්ඡේදයක් සසර සැරිසැරීම අවශ්‍ය බව අවධාරණය කරන්නා සේ පෙනී යයි. මීට ඉහතින් දැක්වූ ඉන්ද්‍ර මුඛාරෝපිත බ්‍රාහ්මණ සිද්ධාන්තයෙන් දැක් වෙන්නේත් මෙය මය. එහි අවසාන අවස්ථාවේ දී ක්ලේශ දමනය අවශ්‍ය බව ප්‍රකාශිත නමුදු ප්‍රමුඛ ස්ථානය දී ඇත්තේ නියමිත අති දීර්ඝ ආත්ම සංඛ්‍යාවක් සසර ගත කළ යුතු බවටය. මෙ වැනි දර්ශනික අදහස් පුරාතන භාරතයට අරුමයක් නොවේ. බෞද්ධ සාහිත්‍යයෙහි බොහෝ විට සඳහන් මක්ඛලිගෝසාල නම් ශාස්තෘවරයාගේ ඉගැන්වීම[22] ද මීට ඒක දේශයකින් සමාන බැවිනි. තව දුරටත් ඉහත කී ඉන්ද්‍ර වාක්‍යය විමසා බලන කල, කෙනෙකු එකම ආත්මභාවයක හෙවත් එකම තත්ත්වයක බොහෝ කාලයක් නැවත නැවත උපදින බව පෙනේ. මේ අදහස ද බෞද්ධ අදහස සමග එක් කිරීම සුකර නොවේ. බෞද්ධ සංකල්පය සම්පූර්ණයෙන් ම කර්මවාදය උඩ ගොඩනැගී තිබෙන අතර හින්දු සංකල්පය නියති වාදයට බර බවත් සම්පූර්ණයෙන් ම වාගේ වර්ණ ධර්මයෙන් පරිපෝෂිත බවත් පැහැදිලිය.[23]

මේ තාක් මෙහි දක්වූ කරුණු අනුව සම්පූර්ණයෙන් ම එක හා සමාන නුවූවත් බුද්ධත්ව සංකල්පයත් විප්‍රත්ව සංකල්පයත් අතර සැලකිය යුතු සම්බන්ධතාවක් පවත්නා බව සිතා ගැනීම දුෂ්කර නොවේ. මේ සම්බන්ධතාව මීට වඩා ඉස්මතු කර ගත හැක්කේ මහාභාරත මතංගෝපාඛ්‍යානයත් ඊට කිසියම් සම්බන්ධයක් ඇතැයි සැලකිය හැකි බෞද්ධ මතංග ජාතකයත්[24] පිරික්සා බැලීමෙනි. කථා වස්තු වශයෙන් මේ දෙකෙහි-කිසියම් සම්බන්ධයක් දක්නට නැත. එහෙත් දෙවැදෑරුම් පරමාර්ථයක් සාධාගනු වස් පෞරාණික කථා කාරයන් විසින් එකකට පිළිතුරු වශයෙන් අනික ගොතන ලද බව අනුමාන කිරීමට තරම් කරුණු නැත්තේ නොවේ. මෙයින් මතංගෝපාඛ්‍යානයෙහි සාරාංශය මෙසේයි :

මතංග වනාහි විවාපත් බැමිණියක කුස උපන් අවජාතක තරුණයෙකි. ඔහුගේ නියම පියා ශුද්‍ර වංශයට අයත් කරනැවැමියෙක් විය. එහෙත් මේ රහස නොදත් බැමිණිය ගේ නීත්‍යනුකූල බමුණු ස්වාමිපුරුෂයා තම පුත්‍රයාය යන හැඟීමෙන් බමුණු සිරිත් විරිත් අනුව ඔහු හද වඩා ගත්තේය. දිනක් හෙතෙම යඥයක් පිණිස හෝ යඥයකට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගෙන එනු පිණිස මතංග පිටත් කර හැරියේය. ඔහු ඒ ගමන ගියේ ලාබාල ගදුබුවෙකු යෙදූ රථයකිනි. අතර මගදී තම මෑණියන් දුටු ගදුබු තෙමේ එදෙසට හැරී ගමන් කරන්නට විය. මෙයින් කෝපයට පත් මතංග තමා අත තුබූ කෙවිටෙන් කීප විටක් ගදුබුවාගේ නැහැයට ගැසීය. කෙවිටි පහරින් සිදු වූ තුවාල දැක දරක ප්‍රේමයෙන් සිත් වේදනාවට පත් ගදුබු මෑණියෝ, "පුත ශෝක නොකරව, නුඹ රියෙහි යොද ගමන් ගත්තේ චණ්ඩාලයෙකි. බ්‍රාහ්මණයා වනාහි කිසිසේත් දරුණු කෙනෙක් නොවේ. බ්‍රාහ්මණායයි කියන්නේ සියල්ලන්ගේ ශාස්තෘවරයකු වූ කාරුණික තැනැත්තෙකුට ය. මේ පාපියා වනාහි ලාබාලයෙකු කෙරෙහි පවා දයාවක් නැති ජාතක කළ පියාට සම ගතිගුණ ඇත්තෙකි." යි කියමින් සිය පුතු සැනසූහ. මෙයැසූ මතංග වැඩි දුරටත් ගදුබු දෙනගෙන් තම වගතුග විමසා නිශ්චය වශයෙන් ම තමා අවජාතක කෙනෙකු බව දැන පෙරලා සිය ගෙට ගොස් මෙතෙක් පියා යැයි සිතා සිටි බමුණාට සියලු පුවත් පවසා සත්‍ය විප්‍රත්වය ලබනු පිණිස මහ වනයට ගොස් ඉහත සඳහන් කළ පරිදි අති උග්‍ර තපසක් ඇරඹීය. මෙයින් රත් වූ ඉන්ද්‍ර ඔහු වෙත පැමිණ විප්‍රත්වය ලබා ගැනීමේ ඇති දුෂ්කරත්වය

---

21. එම, 13, 28, 5.
22. *Sāmaññaphala Sutta*, *Dīgha-nikāya*, Vol. 1, PTS, 1967, pp. 53, 54.
23. "බ්‍රාහ්මණ්‍යං තාත දුෂ්ප්‍රාප්‍යං වර්ණෛඃ ක්ෂත්‍රාදිභිස්ත්‍රිභිඃ,
පරං හි සර්වභූතානාං ස්ථානමේතද් යුධිෂ්ඨිර."
MBH. BORI, 13. 28. 4.
24. Ja. Vol. IV, PTS, 1963, p. 375 ff.

නැවත නැවතත් ඉහත කී පරිදි පැහැදිලි කොට වෙනයම් වරයකින් තෘප්ත වන ලෙස මතංගට අවවාද කෙළේය. මුලදී ඊට එකඟ නොවූ මතංග විප්‍රත්වය ම පතා උක්ත ප්‍රකාර අසම සම දුෂ්කර ක්‍රියාවක් කොට ඉනිදු අභිමතාර්ථය සිද්ධ නොවූ හෙයින් අන්තිමේ දී තමා ගත් ක්‍රියා මාර්ගය නොකැමැත්තෙන් අත්හැර, " කැමැති විටෙක කැමැති වේෂයකින් කැමැති තැනකට අහසින් පිවිසිය හැකි වෙම්වා! බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය දෙපක්ෂයේ පූජාවට භාජන වෙම්වා! මරණින් මතු මාගේ කීර්ත්තිය ලොව සැම තැන පැතිරේවා!" යන වරය ඉල්වීය. ඉන්ද්‍ර ද " චන්ද්‍රදේව ඉතිඛ්‍යාතඃ ස්ත්‍රීණාං පූජ්‍යො භවිෂ්‍යසි " යනුවෙන් වර දී අතුරුදහන් විය. මතංග එහිදී ම මිය පරලොව ගොස් තමා ලත් වරයට අනුව උපත ලැබීය.[25]

කථාව වශයෙන් සම නොවුව ද මෙහි එන ඉන්ද්‍ර–මතංග සංවාදයෙහි අන්තර් ගත කරුණු බෞද්ධ සාහිත්‍යයෙහි තැනින් තැන, විශේෂයෙන් ජාතකට්ය කථාවෙහි එන බුද්ධත්ව සංකල්පය පිළිබඳ අදහස්වලට බොහෝ සෙයින් සමාන බව මුලින් පෙන්වා දෙන ලදි. ඒ මේ අදහස් සංසන්දනයෙන් ප්‍රකටව පෙනී යන කරුණක් නම් මුල් මහා භාරත කතුවරයා හෝ, යමෙක් මතංගෝපාඛ්‍යානය ගොතා මහා භාරතයට පසුව එක් කෙළේ නම් ඔහු හෝ වර්ණාශ්‍රම ධර්මය හෙවත් බ්‍රාහ්මණ මාහාත්ම්‍යය හුවා දැක්වීමට ඉමහත් වෙහෙසක් ගත් බවයි. මතංගෝපාඛ්‍යානයෙන් නොනැවතුණු මහාභාරත කතුවරයන් තවත් අධ්‍යාය කීපයකින් ම කරන්නේ බ්‍රාහ්මණ ප්‍රශංසාවයි.[26] මෙතරම් ආයාසයකින් පුන පුනා කරනු ලබන මේ බ්‍රාහමණ ප්‍රශංසාව හා විප්‍රත්වය හුවා දැක්වීම කිනම් කරුණක් මුල් කර ගෙන දැයි විමසා බලනු වටී. මෙහි දී පැරණි භාරතීය ආගම් හා ඒ පිළිබඳ සාහිත්‍යයන් හදාරණ විමර්ශනශීලී ඡාත්‍රයෙකුගේ අවධානය එක් වරම බෞද්ධ සාහිත්‍යයෙහි බොහෝ විට දක්නට ලැබෙන බ්‍රාහ්මණාධිකාරයට නිගා දෙන, බ්‍රාහ්මණ ධර්මයට පටහැනි ප්‍රකාශයන්[27] දෙසට යොමු වනු ඒකාන්තය. මේ ප්‍රකාශයන් අතර ප්‍රමුඛ

---

25. MBH. BORI, 13. 28-30.
26. එම Anusāsana Parvan, 31, 33, 34, 35, 36 etc.
27. නිදසුන් සඳහා පහත සඳහන් සූත්‍ර හා ජාතකාදිය බලන්න.

*Sutta-nipāta*, PTS, 1948,
Vasala Sutta, p. 21 ff.
Brāhmana-dhammika Sutta, p. 50 ff.
Sundarika-bhāradvaja Sutta, p. 79 ff.
Vāsiṭṭha Sutta, p. 115 ff.

*Dīgha-nikāya*, Vol. 1, PTS, 1967,
Ambaṭṭha sutta, p. 87 ff.
Soṇadaṇḍa Sutta, p. 111 ff.
Tevijja Sutta, p. 235 ff.

*Dīgha-nikāya*, Vol. III, PTS, 1960 ;
Aggañña Sutta, p. 80 ff.

*Majjhima-nikāya*, Vol. II, PTS, 1951,
Assatāyana Sutta, p. 147 ff.
Esukāri Sutta, p. 177 ff.
Subha Sutta, p. 196 ff.

*Jātaka* Vol. 1, PTS, 1962.,
Sālittaka Jā. p. 418 ff.

*Jātaka* Vol. II, 1963,
Satadhamma Jā. p. 82 ff.

*Jātaka* Vol. III, 1963,
Setaketu Jā. p. 232 ff.

*Jātaka* Vol. IV, 1963,
Takkāriya Jā. p. 242 ff.
Uddālaka Jā. p. 279 ff.
Dasabrāhmana Jā. p. 360 ff.

ස්ථානයක් ගන්නා මාතංග ජාතකය[28] ගැන සලකා බැලීමෙන් භාරතීය ආගමික චින්තාවලියෙහි වැදගත් ස්ථානයක් හෙළි පෙහෙළි කර ගත හැකි වේයැයි සිතේ. මීට ඉහතින් විස්තර කළ මහාභාරත මතංගෝපාඛ්‍යානයෙහි කථා නායකයා වූ මතංගත්, මාතංග ජාතකයෙහි කථා නායකයා වූ මාතංගත් අතර නම් වශයෙන් පවත්නා සම්බන්ධය තරම් ප්‍රකට සම්බන්ධයක් චරිත වශයෙන් නොලැබෙන බව නැවතත් මෙහි දී සඳහන් කරනු වටී. පරමාර්ථ දෙකක් මුල් කරගෙන රචිත කථා දෙකෙහි කිසියම් සාම්‍යයක් දැකීම ද උගහට ය. එහෙත් මාතංග ජාතකයත් මහා භාරත මතංගෝපාඛ්‍යානයත් කියවන පාඨකයකුගේ සිතෙහි නිතැතින් ම පහළ වන හැඟීමක් නම් මේ කථා වස්තු දෙකින් එකක් අනිකට පිළිතුරු වශයෙන් රචනා කරන්නට ඇත යන්නයි. මේ බව මෙහි දී ස්ඵුට කළ හැක්කේ මාතංග ජාතකයෙහි හා ඊට සම්බන්ධ වෙනත් බෞද්ධ කථාවන්හි දළ සාරාංශය වත් ගෙන හැර පෑමෙනි.

බරණැස සමීපයෙහි උපන් මාතංග නම් ගුණවත් සැඩොල් තෙමේ දිනක් උයන් කෙළියට ගිය දිට්ඨමංගලිකා නම් බරණැස් සිටු දියණියගේ පරිජනයන් විසින් පෙළනු ලැබීය. එකල තදින් පැවැති කුලවාදය නිසා මෙසේ නිකරුණේ අතවරයට භාජන වූ මාතංග සිටු මැඳුර ඉදිරියෙහි උපවාසයක් ආරම්භ කොට දිට්ඨමංගලිකාවන් ලබා නුවරුන් බලා සිටියදී ම ඇය කර පිටින් ස්වකීය ගෘහය කරා ගියේය. මෙසේ සිටු දියණිය උපහාසයට ලක් කෙළේ ඇය කෙරෙහි ඇති වෛරයකින් නොව නිකරුණේ තමාට කළ අතවරය නිසාය. එහෙත් කාරුණික මාතංග දිට්ඨමංගලිකාවන් සාමාන්‍ය සැඩොල් බියරික් වශයෙන් තබා ගෙන සදහට ම මහජන අවමානයට ලක් කිරීමට කල්පනා නොකොට ඇය සර්වප්‍රකාරයෙන් ම සමාජයේ උසස් තත්ත්වයට නංවා ලීමට උපා සෙවීය. මීට තිබෙන එක ම මග පැවිද්ද බැව් දුටු හෙතෙම දිට්ඨමංගලිකාවට ඔවා දී වල් වැද පැවිදිව සත් දිනක් ඇතුළත දී ම පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා සත් වැනි දින අහසින් අවුත් සැඩොල් ගම් දෙර බැස සිය නිවස කරා ගියේය. පැවිදි වෙස් ගත් සැමියා දැක හඬන්නට වන් දිට්ඨමංගලිකාවන් සැනසූ මාතංග, ''සොඳුර, මම නුඹ පෙරටත් වඩා උසස් තත්ත්වයට නංවා ලමි. ඒ සඳහා ඔබ, 'මගේ සැමියා මාතංග නම් සැඩොලා නොව මහා බ්‍රහ්මයාය. දැනට බඹ ලොව ගොස් සිටින ඔහු මින් සත් වැනි පුණු පොහෝ දින සඳ මඬල පළාගෙන මා වෙත එන්නේය'යි මහ ජනයා අතර ප්‍රචාරය කරව''යි කීය. මෙසේ දිට්ඨ මංගලිකාවට ඔවා දුන් හෙතෙම ආපසු රහසින් හිමවතට ම ගියේය. ඕ ද එසේ කිරීමට කිසිසේත් පසුබට නොවූවාය. මහ ජනයා ද ඇගේ කීම විශ්වාස කළහ. නියමිත දින මධ්‍යම රාත්‍රියෙහි මහා බ්‍රහ්මාත්මභාවයක් මවා ගත් මාතංග සඳ මඬල දෙබෑ කොට නික්ම දිට්ඨමංගලිකාවන් වුසූ සැඩොල් ගෙය කරා ගියේ සැදැහැයෙන් ඉපිල ගිය බ්‍රහ්ම භක්තිකයන්ගේ අසීමිත ගෞරවාදරයට පාත්‍ර වෙමිනි. එහි දී නැබ පිරිමැදීමෙන් දිට්ඨමංගලිකාවන් ගැබ් ගැන්වූ මාතංග ඇයට දිය යුතු ඔවා දී නැවත සඳ මඬලට ම පිවිසියේය. බ්‍රහ්ම භක්තිකයන් විසින් එළවන ලද ලාභයෙන් හා යසසින් අග තැන් පත් දිට්ඨමංගලිකාවෝ නොබෝ කලකින් ම ඇතුළු බරණැස සුවිසල් පහයක හිමි කාරිය වූවා පමණක් නොව මහ බඹු පුදනුවන්ගේ මුදුන් මල්කඩ බවට ද පැමිණියාහ.

මීට පසු මාතංග නැවැත බරණැසට පැමිණියේ වේද මදයෙන් මත්ව සොළොස් දහසක් බමුණන්ට නිති දන් දීමෙන් නොමඟ ගිය දිට්ඨමංගලිකා පුත් මණ්ඩව්‍යයන් සුමගට ගෙනෙනු පිණිසය. බමුණන් දන් වළඳද්දී දිට්ඨමංගලිකා ප්‍රාසාදයට පිවිසි මාතංග මණ්ඩව්‍ය යන් විසින් පිට මං කරන ලද්දේ '' හොර තවුසෙකැ''යි නින්ද අපහාස කිරීමෙනි. එහෙත් ඉන් මඳකුදු කුපිත නොවූ මාතංගයන් අහසින් ගොස් නුවර අන් තැනෙක සිඟා ලද බොජුන්

28. Jā. Vol. IV, PTS, 1963, p. 375 ff.

එක් තැනක හිඳ වලඳද්දී කිපුණු නගර දේවතාවන් ආවිෂ්ට වීමෙන් පිටු පසට හැරී ගිය හිසැති, දරදඬු වී ගිය අත පයැති මණ්ඩව්‍ය ප්‍රධාන සොළොස් දහසක් බමුණෝ සිහිසන් නොමැතිව බිම ඇද වැටී මුවින් පෙණ දමමින් එහි මෙහි පෙරළෙන්නට වූහ. මේ විප්‍රකාරය දුටු දිට්ඨමංගලිකා වහා මාතංග තවුසන් සොයා ගොස් සිය පුතුට කමා කරන මෙන් අයැද සිටියාය. මෙහි දී ඇගේ ඉල්ලීම පිළිගත් මාතංගයන් ඔවුන් සුවපත් කෙළේ කමා අනුභව කොට ඉතිරි කළ මිශ්‍ර ආහාර දිය හා මුසු කොට දිට්ඨමංගලිකාවන් ලවා පෙවීමෙනි. චණ්ඩාල ඉඳුල් පීමෙන් ලජ්ජාවට පත් ඒ බමුණෝ ගම රට ද අත් හැර මෙජ්ඣ රටට පලා ගියෝය. මණ්ඩව්‍ය සිය මෑණියන්ගේ අවවාද පරිදි ඊට පසු සිල්-වතුනට පමණක් සංග්‍රහ කරමින් යහ මග ගමන් ගති.

මින් නොනැවතුණු මාතංග මීළඟට කෙළේ වේත්‍රවතී නදී තීරයෙහි වුසූ ජාතිමන්ත නම් කුලමානී බමුණු තවුසා දමනය කිරීමයි. මේ සඳහා ඉහල ගංතෙර තැනෙක නවාතැන් ගත් මාතංග, '' ජාතිමන්තගේ ජටාවෙහි රැඳෙවා''යි ඉටා වළඳා ඉවත් කළ දැහැටි දඬු ගඟ දියට දැමීය. ඉටූ පරිදි ම කාර්යය සිද්ධ විය. මෙයින් කෝපාවිෂ්ට වූ ජාතිමන්ත විසින් අණ කරනු ලැබ පහල ගංතෙර තැනෙක නැවතුණු මාතංග නැවතත් පෙර සේම දැහැටි දඬු ගඟ දියට දැමීය. උඩුගං බලා ගිය ඒ දැහැටි දඬු ද පළමු වතාවේ මෙන් ජාති-මන්තගේ ජටාවෙහි ම පතිත විය. මෙයින් පෙරටත් වඩා කෝපයට පත් ජාතිමන්ත කළේ, '' මින් සත් වැනි දින තාගේ හිස සත් කඩකට පැළේවා '' යන ශාපයයි. ශාපය ආපසු යන බව දිවැසින් දුටු මාතංග එදින හිරු උදව වලක්වා නොසන්සුන්භාවයට පත් මිනිසුන් ලවා ජාතිමන්ත තම පා මුල දණ ගස්වා, මැටි පිඩක් හිස මත තබවා, දියෙහි ගිල්වා පීමෙන් තව දුරටත් හාස්‍යයට ලක්කොට පැමිණෙන්නට ගිය මහ විපතින් ඔහු මුදා ගත්තේය.

ජාතක කථාවෙහි දැක්වෙන පරිදි මාතංගගේ අවසන් කාර්යය වූයේ මණ්ඩව්‍ය දනය පිළිගැනීමට පැමිණ සිදු වූ සිද්ධියෙන් ලජ්ජිත ව ගම රට අත් හැර ගිය බමුණන් නැවතත් දමනය කිරීමට මෙජ්ඣ රටට යෑමයි. මෙහි දී මාතංග හඳුනා ගත් බමුණෝ ඔහු මායාකාර විද්‍යාධරයෙකැයි මෙජ්ඣ රජුට අවබෝධ කොට රාජ පුරුෂයන් ලවා මරවා දැමූහ. මෙයින් කිපුණු දෙවියන් නිසා මෙජ්ඣ රට ද විනාශ විය.

මෙහි දැක්වූයේ ජාතක කථාවෙහි සඳහන් මාතංග පිළිබඳ ප්‍රධාන පුවත් ඉතා සැකෙවිනි. මේ හැර මාතංග ගැන තොරතුරු හා කථා බෞද්ධ සාහිත්‍යයෙහි තවත් කීපපලක ම දක්නා ලැබේ. සුත්ත නිපාතයට අයත් වසල සූත්‍රයෙහි එන,

'' න ජච්චා වසලො හොති, න ජච්චා හොති බ්‍රාහ්මණො,
කම්මනා වසලො හොති, කම්මනා හොති බ්‍රාහ්මණො,

යන සුප්‍රකට ප්‍රකාශය සනාථ කිරීමට නිදසුන් වශයෙන් ද පෙන්වා ඇත්තේ මාතංග චරිතයයි. එහි ඉමහත් කීර්තියට පත් වූ මාතංග නම් පහත් චණ්ඩාලයාට උවැටන් කරනුවස් බොහෝ ක්ෂත්‍රිය බ්‍රාහ්මණයන් පැමිණි බවත් කාම රාගය දුරු කළ ඔහු බ්‍රහ්ම ලෝකයෙහි උපන් බවත් සඳහන් වේ.[29] සාරත්ථප්පකාසිනී නම් සංයුක්ත නිකායට්ඨ කථාවෙහි ද මාතංග-ජාතිමන්ත හබයක් ගැන ප්‍රකාශ වේ. ජාතක කථාවෙහි සඳහන් මාතංග-ජාතිමන්ත ප්‍රවෘත්තියට බොහෝ සෙයින් සමාන මෙය සිදු වූයේ බරණැස එක්තරා කුම්භකාර ශාලාවක දී බවත් අවසානයේ දී පෙර සේ ම මාතංග ගේ කරුණා මහිමයෙන්

29. *Sutta-nipāta*, PTS, 1948, pp. 23, 24.

ජාතිමන්ත ශාප විපාකයෙන් මිදුණු බවත් එහි දැක්වේ.[30] මේ අතුරු කථාව ම තවත් මඳක් වෙනස් කොට ධම්මපදට්ඨ කථාවෙහි ද සඳහන් වේ.[31] බෞද්ධ සාහිත්‍යයෙහි මාතංග පිළිබඳ ව දැක්වෙන තවත් ග්‍රන්ථයක් නම් චරියාපිටකයයි. එහි පැවැසෙන අන්දමට මාතංග තවුසා ජීවිතක්ෂයට පත් වූයේ ඔහු සමහ ගංගා නම් ගං ඉවුරෙහි එක් අසපුවක වාසය කළ ඊර්ෂ්‍යාකාරී බමුණු තවුසෙකුගේ ශාපයෙනි. මෙහි දී මාතංග කෙතරම් ගුණවත් වූයේ ද යත්, තමාට අහේතුකව ශාප කළ බමුණු තවුසාට ප්‍රතිශාප කිරීමට තරම් වත් හේ උත්සුක නොවීය.[32]

මේ කථා සාරාංශයන් දෙස බැලීමෙන් මේ කිසිවක් වස්තු වශයෙන් මතංගෝපාඛ්‍යානයට සමාන නොවන බව පැහැදිලිය. එහෙත් මතංගෝපාඛ්‍යානයෙහි අන්තර්ගත ප්‍රධාන කරුණු, එනම් විප්‍රත්වය පිළිබඳ අදහස්, බෞද්ධසාහිත්‍යයෙහි දැක්වෙන බුද්ධත්වය පිළිබඳ බොහෝ අදහස්වලට ලංවන බව පෙනේ. මීට හේතු විමසීමේ දී බැසගත හැකි නිගමනයක් නම් බෞද්ධ මාතංග ජාතකය හා වෙනත් මාතංග කථා නිසා බමුණු ඇදුරන් විසින් අමුතු මතංග කථාවක් රචිත බවයි. මුලදී බුදුන් වහන්සේගේ තදබල විවේචනයටත් පසුව තදනුගාමීන්ගේ නිර්දය උපහාසයටත් ලක් වූ බමුණු ඇදුරන්ට තව දුරටත් නිහඬව සිටිනු නොහැකිවූවා සේ පෙනේ. එබැවින් බෞද්ධයන්ට ව්‍යංගයෙන් පිළිතුරු දීම පිණිස ඔවුන් මතංගෝපාඛ්‍යානය ගොතා මහාභාරතයට ඇතුළත් කළහයි සිතීමට තුඩු දෙන සාක්ෂි කීපයක් ම මේ කථා විමසා බැලීමෙන් මතු කර ගත හැකිය. බෞද්ධ සාහිත්‍යයෙහි වුව ද එකකට එකක් තරමක් දුර වෙනස් මාතංග කථා දක්නට ලැබීමෙන් පෙනී යන්නේ මුල් මාතංග කථාව ව්‍යාප්ත වීමත් සමග බොහෝ දුර වැඩී දියුණු වී ගිය බවයි. මුලින් ම බෞද්ධ සාහිත්‍යයෙහි මාතංග ගැන සඳහන් වන්නේ මීට ඉහත සඳහන් කළ පරිදි සුත්තනිපාතයට අයත් වසල සූත්‍රයෙහි යයි සිතේ. එහි ඉතා කෙටියෙන් මාතංග නම් පහත් චණ්ඩාලයා ක්ෂත්‍රිය බ්‍රාහ්මණයන්ගෙන් පුද ලැබ බ්‍රහ්ම ලෝකයෙහි උපන් බවත් ඊට ජාතිය බාධා නොවූ බවත් සඳහන් වේ. ඊලඟට තරමක් දුර දියුණුවී ගිය මේ කථාවෙහි කොටසක් සේ ගත හැකි විස්තරයක් ජාතක පාළියෙහි[33] මෙන් ම වර්තමාන මාතංග ජාතකයෙහි ද දක්නට ලැබෙන ඉපැරණි ගාථා සූවිස්සකින් පමණ දැක්වේ. මේ විස්තරයට ඇතුළත් වන්නේ මණ්ඩව්‍යගේ බ්‍රාහ්මණ දානය පිළිබඳ පුවතයි. මීට අනතුරුව ජාතකට්ඨකථා, චරියාපිටක, සාරත්ථප්පකාසිනී, ධම්මපදට්ඨකථා යන ග්‍රන්ථයන්හි දක්නට ලැබෙන මාතංග කථා හා ඒ පිළිබඳ අතුරු කථා විකාශනය වී යයි සිතිය හැක. බමුණන් හා ඔවුන්ගේ වර්ණාශ්‍රම ධර්මය තදින් ම හාස්‍යයට ලක් කොට ඇත්තේ පසුව කී මේ කථාවන්හිය. කාල වශයෙන් දමේවා බොහෝ සෙයින් ම මහා භාරත කාලයට ලං වන බව ද පෙනේ.[34] කරුණු මෙසේ හෙයින් බෞද්ධ 'මාතංග' යන නාමයට හාත්පසින් ම සමීප 'මතංග' නමැති කථා නායකයෙකු නිර්මාණය කොට බෞද්ධ අදහස් අනුකරණයෙන් ඔහු වටා කථාවක් ගොතා බෞද්ධයන් මාතංග කථාවලින් හා වෙනත් දේශනයන්ගෙන් සමච්චලයට භාජන කළ වර්ණාශ්‍රම ධර්මය හා බ්‍රාහ්මණ තත්ත්වය රැකා ගැනීම පිණිස බමුණු ඇදුරන් උත්සාහ කළ බව සිතීම අහේතුක නොවේ. මෙහි ලා සැලකිය යුතු තවත් වැදගත් කරුණක් නම් මහාභාරත මතංග කථාවට වඩා

---

30. *Sāratthappakāsini*, Vol. H, PTS, 1932, pp. 241, 242.
31. *Dhammapadaṭṭhakathā*, Vol. I, PTS, 1906, pp. 39-43.
32. Cariyāpiṭaka, ed. B. C. Law, 1949, p. 32.
33. ජාතක පාළි, හේවාවිතාරණ මුද්‍රණය, 1955, 216—129 පිටු.
34. දැනට සාමාන්‍යයෙන් බැස ගෙන ඇති නිගමනයට අනුව ක්‍රිස්තු පූර්ව සිව් වැනි සිය වසේදී පමණ පටන් ගත් මහාභාරතය නිමාවට පත් වූයේ ක්‍රිස්තු වර්ෂයෙන් සිව් වැනි සිය වසේදී පමණය. මේ ගැන කියවන්න: Winternitz : *A History of Indian Literature*, Vol. 1, part II, 1963, pp. 399-417.

බෞද්ධ මාතංග කථාව සාධක අනුව ඉපැරණි බව පෙනී යාමයි. තව ද මහා භාරත මතංග කථාව ගෙතූ බමුණු ඇදුරා ඉතා සියුම් ලෙස බෞද්ධයන්ට පිළිතුරු දෙන්නේ දළ වශයෙන් වර්ණාශ්‍රම ධර්මය නිවැරදිය යි කියා නොව එය පදනම් කොට ගොඩ නගා ගත් විප්‍රත්වය බුද්ධත්වයටත් වඩා උසස් තන්හි තබා ලීමෙනි. මේ බව මෙහි මුලදී විස්තර කළ බුද්ධත්ව සංකල්පය හා විප්‍රත්ව සංකල්පය විමසා බැලීමෙන් පෙනේ. තව දුරටත් මතංග ඉන්ද්‍ර-ගෙන් ඉල්ලූ වරය ගැන ද විමසා බලන විට පෙනී යන්නේ එහි සඳහන් සියලුම ලක්ෂණ බෞද්ධ සාහිත්‍යයෙහි මාතංග ගැන සඳහන් තැන්වල දක්නට තිබෙන බවයි. කැමැති විටෙක කැමැති වේෂයකින් කැමැති තැනකට අහසින් යැමේ හැකියාව මාතංගට තිබුණ බව ජාතක කථාවෙන් මනාව පැහැදිලිය. බ්‍රාහ්මණ ,ක්ෂත්‍රිය දෙපක්ෂයේ පූජාවට භාජන වූ බව ජාතක කථාවෙහි මෙන් ම ඉහත කී සුත්තනිපාත ගත වසල සූත්‍රයෙහි ද සඳහන් වේ. මරණින් මතු ඔහුගේ කීර්තිය ලොව පැතුරුණු බව ද බෞද්ධ සාහිත්‍යයෙහි ඔහු ගැන සඳහන් හැම සිද්ධියකින් ම පාහේ අනාවරණය වේ. මෙයින් සමහර විට මතංගෝපා-ඛ්‍යාන කතුවරයා අදහස් කරන්නට ඇත්තේ බෞද්ධයන් සඳහන් කරන මාතංග අනිකෙකු නොව ඊට පෙර ආත්ම භාවයේ දී මතංග නමින් සිටි චඩාලයා ම බවත් ඉන්ද්‍ර දෙවියන් ගෙන් ලත් වරයේ බලයෙන් එවැනි සමත් කම් කළ බවත් පාඨකයාට හැඟවීම ය.

මේ හැර මේ කථා දෙක්හි පවත්නා ගුප්ත සම්බන්ධය හෙළි කරන සැලකිය යුතු මහාභාරත පාඨයක් ද මෙහි දී ඉදිරිපත් කළ හැක. එනම්, "චන්ද්‍රදෙව ඉතිඛ්‍යාතඃ ස්ත්‍රීණාං පූජ්‍යො භවිෂ්‍යසි "[35] යන්නයි. " (මතංග, නුඹ මරණින් මතු) චන්ද්‍රදේව නමින් ප්‍රසිද්ධව ස්ත්‍රීන් විසින් පුදනු ලබන්නෙක් වෙහි" යනු එහි අදහසයි. අන්තිම වශයෙන් ඉන්ද්‍ර දෙවියන්ගෙන් මතංගට ලැබුණු වරයයි මේ ශ්ලෝකාර්ධයෙන් පැවැසෙන්නේ. දැනට මුද්‍රිතව පවත්නා හැම මහා භාරත පිටපතක ම ඇත්තේ "චන්ද්‍රදෙව" කියා නොව 'ඡන්දොදෙව' කියා යි. සමහර විට මෙය තවමත් මහාභාරතයෙහි තිබෙන අශුද්ධ පාඨයන්ගෙනන් එකක් විය හැකියි. 'ඡන්දොදෙව' යන්නෙන් ගත හැකි අර්ථය නම් 'ඡන්දස් දෙවි' යනුයි. ප්‍රතාප චන්ද්‍ර රායි මහතාගේ මහාභාරත ඉංග්‍රීසි පරිවර්තනයෙහි[36] එන්නේ ද මේ අදහස මය. එහෙත් මෙය කිසිසේත් තැනට ගැළපෙන අදසහක් නොවන බැවින් දෝ පූනා මහා භාරත සංස්කරණයෙහි අනුශාසන පර්වය ශුද්ධ කළ රාමචන්ද්‍ර නාරායන් දණ්ඩේකාර් පඬිවරයා 'ඡන්දොදෙව' යන්න සැක සහිත බව සලකුණු කොට මදුරාසි මහා භාරත මුද්‍රණයෙහි 'චන්ද්‍රදෙව' කියා තිබේ යැයි අධෝ ලිපියකින් දක්වා තිබේ.[37] එහෙත් අපට දක්නට ලැබුණු මදුරාසි මහා භාරත මුද්‍රණයෙහි වුව ද ඇත්තේ චන්ද්‍රදේව' නොව 'ඡන්ද්‍රදෙව' කියායි.[38] දේව නාගරී අක්ෂරයෙන් ලිඛිත 'චන්ද්‍ර' යන්න 'ඡන්ද්‍ර' යයි පහසුවෙන් වැරදිය හැකි බැවින් මෙය චිරාගත ලේඛක දෝෂයක් විය යුතුය. මාතංග ජාතකය ආශ්‍රයෙන් බලන විට 'චන්ද්‍රදෙව' යන්න ම මෙහි ශුද්ධ පාඨය යි සිතිය හැකිය. එහි මාතංග බ්‍රහ්මාත්මභාවයක් මවා ගෙන මහජනයා බලා සිටිය දී පුන් සඳ මඬල දෙබෑ කරමින් දිට්ඨමංගලිකාවන්ගේ ගෘහය කරා පැමිණි බව සඳහන් වන හෙයිනි.[39] තව ද විශේෂයෙන් ස්ත්‍රීන්ගෙන් පුද සැලකිලි ලැබීමේ වාසනා මහිමය මාතංගට නිසර්ග-යෙන් පිහිටා තිබුණු බව ද ජාතක කථාවෙන් බොහෝ විට ධ්වනිත වන්නේය. උත්-පත්තියෙන් චණ්ඩාලයෙකු වූ මාතංගට කල් යාමේ දී කුලීන දිට්ඨමංගලිකාවන් දැක් වූ භක්තිය හා ඉමහත් හරසර මෙහි දී සැලකිල්ලට ගත යුතු ය. මේ ආදි කරුණු විමසා බලන කල මහාභාරත මතංගෝපාඛ්‍යානය මාතංග ජාතකයෙහි හා බුද්ධත්ව සංකල්පයෙහි ගුප්ත අනුකරණයකැයි සිතා ගැනීම සහේතුක වෙයි.

---

35. MBH. BORI, 13. 30. 14.
36. MBH. English Tr. Vol. IX, 1893, p. 205.
38. Ibid., Madras ed. Vol. XVI, 1935, p. 36.
39. Jā. Vol. IV, PTS, 1963, p. 377.



12—11886